# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2346/11 – 2023 අගෝස්තු මස 21 වැනි සඳුදා – 2023.08.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2021/155.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.10.15 දිනැති හා අංක 2301/62 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.10.06 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් නාත්තණ්ඩිය, දුන්කන්නාව, මානිංගල, '' අමා '' හි පදිංචි කේ. නාලනී ප්‍රේමලතා මිය සහ කොළඹ 15, රොක් හවුස් පටුමඟ පිහිටි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A60/2022 හා 2023.07.31 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අගෝස්තු මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G40177 – 18(2023/08)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය.**

අංකය: ඒ/60/ 2022.
1R /COM/03/2021/155.

කේ. නාලනී ප්‍රේමලතා මිය,
'' අමා ''
මානිංගල, දූන්කන්නාව,
නාත්තණ්ඩිය.

*පළමු පාර්ශ්වය*

සහ

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
රොක් හවුස් පටුමඟ,
කොළඹ 15.

*දෙවැනි පාර්ශ්වය*

*අතර ඇති කාර්මික ආරාවුල*

**ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

මෙම පාර්ශ්වයන් අතර ඇති ආරාවුල ලෙස කම්කරු කොමසාරිස් ජනරාල් මා වෙත යොමුකර ඇත්තේ 1996.07.23 වන දින සිට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සේවය කරන කේ. නාලනී ප්‍රේමලතා මහත්මියට

01. 2009.11.03 සිට මාණ්ඩලික නිලධාරි තනතුරට උසස්වීමක් ලබා දී ඇති නමුත් 2013.06.01 දින දක්වා එම තනතුරට අදාළ වැටුප ලබා නොදීම.

02. 2009 සිට 2014 වසර වන විට වසර 05 ක කාලය සම්පූර්ණ වීම මත එම්. එම්. 1-1-2016 ශ්‍රේණිය ලබා නොදීම හා ඊට අදාළ වැටුපට අමතරව රු. 5,000/- ක වෘත්තීය දීමනාව හිමි නම් එය ලබා නොදීම.

යන කරුණු මගින් අසාධාරණයක් සිදුව තිබේ නම් ලැබිය යුතු වෙනත් සහන කවරේ ද යන්න වේ.

මෙම බේරුම්කරණ 2022.12.02 දින සිදු කරන ලද දිනයේ දී ඉල්ලුම්කාරිය තම කථාන්තරය වාචිකව දැන් වූ අතර වග උත්තරකාර පාර්ශ්වයේ නීතීඥවරිය ප්‍රකාශ කර සිටියේ මේ පිළිබඳව සමථයකට එළඹීමේ හැකියාව වගඋත්තරකාර ආයතනයේ මානව සම්පත් කළමනාකරණ අංශය විසින් දැනුම් දී ඇති බවත් ඉල්ලුම්කාරියගේ ඉල්ලීම අවශ්‍ය ගණනය කිරීම් කිරීමෙන් පසුව ලබාදීමට කැමති බවත් ය. මෙහිදී බේරුම්කාර මා නියෝග කලේ පාර්ශ්වයන්ට නඩුවේ විස්තරය දිවුරුම් පෙත්සම් මගින් ඉදිරිපත් කරන ලෙසය.

ඒ අනුව ඉල්ලුම්කාරිය සිය දිවුරුම් පෙත්සම 2022.12.22 හෝ ඊට ප්‍රථම ද වගඋත්තකාර පාර්ශ්වයේ දිවුරුම් ප්‍රකාශය 2023.01.16 දින හෝ ඊට ප්‍රථම ද ඉල්ලුම්කාර පාර්ශ්වයේ 2023.02.03 වන දින දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු විය.

එහෙත් දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත්තේ ඉල්ලුම්කාර පාර්ශ්වය පමණි. කෙසේ වෙතත් අංක 1992/43 හා 2016.11.10 දිනැති *ගැසට්* නිවේදනය අනුව බේරුම්කරණය මාස 03 ක් ඇතුළත නිමාවිය යුතු වේ.

ඒ අනුව බේරුම්කරණ ප්‍රදානය දීමට කටයුතු කරමි.

ඉල්ලුම්කාරිය විසින් 2022.12.11 දින ඉදිරිපත් කරන ලද දිවුරුම් පෙත්සම හා 2023.02.20 දිනැති දිවුරුම් පෙත්සම කෙරෙහි අවධානය යොමු කලෙමි.

01). 2022.12.11 දිනැති දිවුරුම් පෙත්සමේ 1 වගන්තිය අනුව ඉල්ලුම්කාරිය 1996.07.23 වන දින සිට වසර 05 ක කාලයක් සේවය කිරීමෙන් පසුව 2001.11.26 දිනැති (ඇ1) ලෙස නම් කළ ලිපියෙහි ලිපිකරු තනතුරට ස්ථිර පත්වීමක් ලබා දී රු. 4,540/- ක මාසික වැටුප් තලයක තබා ඇත.

02). 2022.12.11 දිනැති දිවුරුම් ප්‍රකාශයේ 2 වන වගන්තිය අනුව නම් කල ලිපිය අනුව ඇයට ලිපිකරු II වන ශ්‍රේණියට උසස් කර 57,120 -7 X 1320+15 X1,560-89,760/- වැටුප් පරිමාණයේ 4,870 මාසික වැටුප් තලයේ පිහිටුවා ඇත.

03). එම දිවුරුම් පෙත්සමේ 3 වන වගන්තිය අනුව 2009.08.04 දිනැති (ඇ03) ලෙස අංකික ලිපියෙන් ඇයව ලිපිකරු 1 සේවයට උසස් කර රු.12,920/-ක මාසික වැටුප් තලයේ තබා ඇති අතර වැටුප් වර්ධක දිනය ලෙස 2010.08.01 ලෙස සඳහන් කර ඇත.

04). 2022.12.11 දිනැති දිවුරුම් පෙත්සමේ 4 වන වගන්තිය අනුව 2009.10.30 දිනැති (ඇ04) ලෙස අංකික ලිපිය අනුව 2009.11.03 දින සිට මාණ්ඩලික නිලධාරි තනතුරට උසස් කර 20,080/- මාසික වැටුප් තලයේ පිහිටුවා වැටුප් වර්ධක දිනය නොවැම්බර් 03 ලෙස දක්වා ඇත. එහෙත් මෙදින සිට නියමිත වැටුප් පියවරේ තබා නැත. එහෙත් මෙදින සිට වැටුප් පරිමාණයේ පිහිටුවා මෙකී ආරවුල සමථයකට පත් කළ හැකි බව ද ඇය ප්‍රකාශ කරයි.

05). 2020. 12.11 දිනැති දිවුරුම් ප්‍රකාශය සමඟ ඉදිරිපත් කර ඇති (ඇ5) නමැති ලිපිය අනුව ඉල්ලම්කාරියට 2013.06.01 දින සිට ක්‍රියාත්මකවන පරිදි රු.25,640/- වැටුප් තලයේ පිහිටුවා ඇති අතර මීලඟ වැටුප් වර්ධක දිනය ජුනි 01 ලෙස ද දක්වා ඇත.

06). එහෙත් එකී 2022.12.11 දිනැති පෙත්සමේ 6 වන ඡේදය අනුව මාණ්ඩලික සේවා තනතුරට පත් වූ 2009.11.03 දින සිට 2013.06.01 දක්වා හිඟ වැටුප (රු.25,640/-20,080/-) එනම් මාසික රු.5,560/- බැගින් ගෙවා සමථයකට පත් කළ හැකි බව ඉල්ලුම්කාරිය යෝජනා කරයි.

07). එකී 2022.12.11 දිනැති දිවුරුම් පෙත්සමේ 14,15,16 ඡේද අනුව රු. 10,000/- ක වෘත්තීය දීමනාවක් හිඟ මුදල් ඉල්ලා ඇතත් එකී ඉල්ලීමේ පදනම පැහැදිලි නැත.

එබැවින් ඉහත අංක 06 අයිතමයේ දක්වා ඇති පරිදි මාසයකට රු.5,560/- ක හිඟ ගෙවීම 2009.11.03 දින සිට 2013.06.01 දක්වා කාලයට ගණනය කර එනම් රු.2,38,709.33 ක මුදලක් (රු. දෙලක්ෂ තිස් අට දහස් හත්සිය නවයයි ශත තිස් තුනක මුදලක්). මෙය ගැසට් ගත කිරීමෙන් මසක් ඇතුළත උතුරු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කරන මෙන් වගඋත්තරකාර ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වෙත නියෝග කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

**විජිතානන්ද මඩවලගම**
බේරුම්කරු.

2023 ජූලි මස 31 වැනි දින දී ය.

EOG 08 - 0225

මගේ අංකය : IR/COM/02/2021/10.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.03.08 දිනැති හා අංක 2322/25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2023.02.28 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බද්දේගම, වැණියරවෙල, මෙත්සිරි පෙදෙස, අංක 36 හි පදිංචි නාලනී විද්‍යාලංකාර මිය සහ කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, අංක 34 හි පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 29/2023 හා 2023.07.07 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අගෝස්තු මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණයේ දී ය**

නඩු අංකය : A/29/2023.
IR/COM/02/2021/10.

1. නාලනී විද්‍යාලංකාර මිය,
   අංක 36 මෙත්සිරි පෙදෙස,
   වැණියරවෙල,
   බද්දේගම.

   (පළමු පාර්ශ්වය)

2. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,
   34,
   ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
   කොළඹ 02.

   (දෙවන පාර්ශ්වය)

**ප්‍රදානය**

*පෙනී සිටීම*
පළමු පාර්ශ්වය වෙනුවෙන්
නීතිඥ අනුෂ්ක රාජපක්ෂ මයා
දෙවන පාර්ශ්වය වෙනුවෙන්
නීතිඥ බී.එන්. නිශාන්ති මිය
නීතිඥ විරස්නි සෙනෙවිරත්න මිය
නීතිඥ කේ.පී. රණවීර මිය
සහකාර සාමාන්‍යාධිකාරී වසන්තා ජයවර්ධන මිය
කළමනාකාර සහකාර ඊ.කේ.පී.එස්.ටී. නවරත්න මයා
කළමනාකාර සහකාර පාලිත නවරත්න මයා

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා ඔහුගේ 2023.02.28 දිනැති ලිපියෙන් මා පත්කොට ඇත.

මෙම ආරවුලට තුඩු දෙන කාරණය ලෙස 2023.02.20 දිනැති කම්කරු කොමසාරිස් ජනරාල්තුමාගේ ලිපියෙන් සඳහන් කර ඇත්තේ-

"ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවය කළ නාලනී විද්‍යාලංකාර මහත්මියට,

- ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී තනතුරෙහි රාජකාරී ඉටුකළ 2011.02.21 දින සිට 2019.07.03 දක්වා හා 2020.06.01 දින සිට 2021.03.11 දක්වා කාලයට වැඩ බැලීමේ දීමනාව හිමි ද හිමිනම් එය ලබා නොදීමෙන්,

- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ 2017.01.31 දිනැති ලිපිය මගින් 2012.03.19 දිනට පෙරදාතම කර JM 1-1 සේවා ගණයේ II ශ්‍රේණියට උසස් කිරීමෙන්,

- JM 1-1 සේවා ගණයේ I තනතුර හිමි ද හිමි නම් එය ලබා නොදීමෙන්,

අසාධාරණයක් සිදු ව තිබේ ද? යන්නත්, අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳව වේ."

මෙම ආරාවුල සම්බන්ධයෙන් නඩු විභාගයන් පැවැත්වූ දිනයන්,

2023.03.14
2023.03.22
2023.03.28
2023.05.09
2023.05.19
2023.06.01
2023.06.12
2023.06.20

මෙම බේරුම්කරණයේ පසුබිම හා එය පැවැත්වූ ආකාරය

මෙම නඩුව පළමුවරට 2023.03.14 දින කැඳවූ අවස්ථාවේ පළමු පාර්ශ්වය සිය පළමු ප්‍රකාශය A 1 සිට A 11 IV දක්වා ලකුණු කරන ලද ඇමුණුම් සමග ඉදිරිපත් කරන ලදී. දෙවන පාර්ශ්වය සිය පළමු ප්‍රකාශය R 1 සිට R 4 දක්වා, සලකුණු කරන ලද ඇමුණුම් සහිතව ඉදිරිපත් කරන ලදී. එම ප්‍රකාශයේ 02 ඡේදයෙන් මෙම නඩුව ඉල්ලුම්කරු හා ආයතනයට සජීවී ගිවිසුමක් නොමැති හෙයින් බේරුම්කරුට මෙම ඉල්ලීම විමසීමට නෛතික බලයක් නොමැති බවට කරන ලද දැනුම් දීම අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

මෙම නඩුවේ ඉල්ලුම්කරු වන නාලිනී විද්‍යාලංකාර මිය, 1981.04.01 දින VII ශ්‍රේණියේ පොත් තැබීමේ ලිපිකරු ලෙස සේවයට බැඳී ඇති අතර 2021.03.11 දින JM-1-1 II ශ්‍රේණියේ ගණකාධිකාරී වශයෙන්, වසර නවයක් සේවය කොට විශ්‍රාම ගොස් ඇත.

ඇයගේ ඉල්ලීම වන්නේ, 2011.02.21 සිට 2019.07.13 දක්වාත්, 2020.06.01 දින සිට 2021.03.11 දක්වා කාලයට වැඩ බැලීමේ දීමනාව හිමිද හිමිනම් එය ලබාදෙන ලෙසටත්, ගණකාධිකාරී සේවයේ JM-1-1 සේවා ගණයේ 1 තනතුර ඇයට හිමිද? හිමි නම් ඇයට එය ලබා නොදීම පිළිබඳව ගැටලුව හා ඇයට හිමි සහන පිළිබඳවයි.

මේ පිළිබඳව ඉල්ලුම්කාරිය ඉදිරිපත් කරන ලද A 2 ලේඛනය අනුව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිගේ අංක 3/2/3/5/7 හා අ 69 හා 2011.02.21 ලිපිය අනුව නාලනී විද්‍යාලංකාර මිය VI ශ්‍රේණියේ ගණකාධිකාරී තනතුරේ රාජකාරී ආවරණය කිරීමට පත් කර ඇත.

ඉන්පසු ඇය (A5) ඇමුණුම අනුව, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිගේ අංක 3/2/1/1/152 හා 2012.01.24 ලිපිය අනුව ඇයට VI ශ්‍රේණියේ ගණකාධිකාරී තනතුරට උසස් කර ඇත. (පිටු අංක 24 - A6)

ඉන්පසු ඉල්ලුම්කාරිය ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ 2017.01.31 හා අංක 3/2/1/1/254 අනුව JM-1-1 සේවා ගණයේ II ශ්‍රේණියට 2012.03.19 දිනට පෙරදාතම් කර පත්කර ඇත.

මේ සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය සිය පළමු ප්‍රකාශයේ 6 වන ඡේදයේ සඳහන් කර ඇත්තේ,

"ඇය වෙත 2012.01.24 සහකාර ගණකාධිකාරී VI තනතුරට උසස්වීමක් ලබාදීම හේතුවෙන් රාජකාරී ආවරණය අහෝසි වී ඇති බවයි. ඒ අනුව නාලනී විද්‍යාලංකාර මහත්මිය සහකාර ගණකාධිකාරී VI ශ්‍රේණියේ රාජකාරී ආවරණය කර ඇත්තේ 2011.02.23 දින සිට 2012.01.24 දින දක්වා කාලසීමාව තුල පමණක් බවයි." (පිටු අංක 48)

තව ද, ශ්‍රී ලංකාණ්ඩුවේ ආයතන සංග්‍රහයේ 12.2.5හි වැඩ බැලීමේ වැටුප හා විශේෂ පරිසමිකය යටතේ අනුව නිසි පත්වීම් බලධාරියා විසින් ඔහු විධිමත් ලෙස පත්කර තිබිය යුතුය. (පුරප්පාඩු වී තිබෙන තනතුරක රාජකාරී ආවරණය කිරීමට යොද ා ඇති දෙපාර්තමේන්තුව වැඩ පිළිවෙළක් යටතේ එම රාජකාරී ආවරණය කරන නිලධාරියෙකුට වැඩ බැලීමේ වැටුපක් නොහොත් කිසිදු අතිරේක පරිශ්‍රමිකයක් ලබාගැනීමට නුපුලුවන.) (R2) යනුවෙන් ඉල්ලුම්කාරිය විසින් 2020.06.01 වන දින සිට 2021.03.11 දක්වා කාලයට වැඩ බැලීමේ දීමනාව ලබා නොදීමෙන් ඇයට අසාධාරණයක් වී ඇති බව සඳහන් කර ඇත.

මේ පිළිබඳව ඉල්ලුම්කාරිය ඇයගේ 2020.05.20 දින ලිපියෙන් ගාල්ල ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් කළමණාකරු අමතන ලද ලිපියෙන් පිටු අංක 35-A9) ඉහත කාලසීමාවට අදාළව "ඇයගේ තනතුරේ රාජකාරියට ඉටු කිරීමට වැඩ බැලීමේ පදනමෙන් දිරිමත්ව රාජකාරී කටයුතු සඳහා පත් කරන්නේ නම් එය ඉටු කළ හැකි බව තවත් අයට පිටපත් සහිතව දැනුම් දී ඇත. (පිටු අංක 35)

මේ පිළිබඳව 2020.07.21 හා අංක 3/2/3/10/2/108 ලිපියෙන් නියෝජ්‍ය සාමන්‍යාධිකාරී (මානව සම්පත් කළමනාකරණ හා පාලන) විසින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ගාල්ල දිස්ත්‍රික් කළමනාකරු වෙත දන්වා ඇත්තේ " ආයතන සංග්‍රහයේ 13.2 යටතේ කිසියම් ධුරයක් තාවකාලිකව පුරප්පාඩු වූ පමණින් එහි වැඩ බැලීම සඳහා පත් නොකළ යුතු බවත් ය."

එම ලිපියේ 03 වන ඡේදයෙන් ඉල්ලුම්කාරියගේ ඉල්ලීම ඉටු කිරීමට හැකියාවක් නොමැති බව සඳහන් කර ඇති අතර ඩී.එස්. රූපසිංහ මහත්මිය ප්‍රසූත නිවාඩු අවසන් ව පැමිණෙන තෙක් ඇයගේ රාජකාරිය ආවරණය කිරීමට ජී.එම්. විද්‍යාලංකාර මහත්මියට දැනුම් දෙන ලෙසටයි. (පිටු අංක 37)

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ JM-1-1 ශ්‍රේණියට 2010/2018 තනතුර සඳහා වන බඳවාගැනීමේ පරිපාටි අනුව ඉල්ලුම්කාරිය මූලික සුදුසුකම් සපුරා නොමැති බවත් ඇය ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් වන්නේ අ.පො.ස. (සා.පෙළ) 1975/අ.පො.ස. (උ.පෙළ) 1978 වන අතර ඇයගේ අතිරේක සුදුසුකම් ලෙසට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ තොරතුරු තාක්ෂණය පිළිබඳව 2005.06.12 සිට 2006.04.29 දක්වා අර්ධ කාලීන පාඨමාලාවක් හදාරා ඇති බවයි. මේ අනුව ඇය මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති බව නිරීක්ෂණය විය. (R3 R4)

තවද, උසස්වීම්වලට අදාළ තනතුරු හා බඳවා ගැනීමේ පරිපාටියේ 5.1 පරිදි, සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාළ කාලයට නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබිය යුතුය. (පිටු අංක 63) (R3 - R4) ඉල්ලුම්කාරිය VI ශ්‍රේණියේ ගණකාධිකාරී වශයෙන් 2012.01.24 උසස්වීමක් ලබා ඇති අතර, ඇය වසර 10ක සේවා කාලය සපුරනු ලබන්නේ 2022.01.24 දිනටය. එහෙත් ඇය ඊට පෙර 2021.03.12 වන දින විශ්‍රාම ගොස් ඇත. මේ අනුව එම අවශ්‍යතාවයද ඇය සම්පූර්ණ කර නොමැති බව පෙනීයයි.

මේ අනුව ඇයට ඊළඟ උසස් වීම වන JM-1-1 සේවක ගණයේ I තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් කොන්දේසි හා අවශ්‍යතා සපුරා නොමැති බැවින්, අදාළ සම්මුඛ පරීක්ෂණවලදී ලකුණු ලබාදීමත් සිදුකර නොමැති බව නිරීක්ෂණය වන අතර,

මේ අනුව ඉල්ලුම්කාරිය අදාළ තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා නොගත් බව පෙනී යයි. ඒ පිළිබඳව සේවක අභියාචනා මණ්ඩලයට එය යොමු කර ඇති බව දෙවන පාර්ශ්වය තම පළමු ප්‍රකාශය සඳහන් කර ඇත.

2023.06.12 දින පැවැත්වූ නඩු විභාගයේ පහත සාක්ෂි සටහන් අනුව,

- ප්‍ර. ඒ වන විටත් අවුරුදු 09ක් පමණ රාජකාරී ආවරණය කරලා තියෙනවා.
- පි. පිළිගන්නේ නෑ.
- ප්‍ර. කොපමණ කාලයකටද සිදුකර තිබෙන්නේ.
- පි. 2011.02.21 සිට 2012.01.24 දක්වා රාජකාරිය ආවරණයක් කර තිබෙනවා. 2012.01.24 සිට සහකාර ගණකාධිකාරී VI වන ශ්‍රේණියට උසස් වීමක් ලබා තිබෙනවා.
- ප්‍ර. ආසන්න ලෙස අවුරුද්දක් පමණ කාලයක් රාජකාරී ආවරණය කර තිබෙනවා.
- පි. මාස 11 කාලයක්
- ප්‍ර. ඔබ කියන ආකාරයට වුනත් මාස 11කට කාලයක් කියන්නේ දීර්ඝ කාලයක්
- පි. ඔව්
- ප්‍ර. ඉල්ලුම්කාරියගෙන් හරස් ප්‍රශ්න කරන විටදී ඇයගේ හරස් ප්‍රශ්නවලට යොමු වුනේ මෙම A2 ලේඛනයේ ශීර්ෂයේ දී තිබෙන විදිහට VI වන ශ්‍රේණියේ සහකාර ගණකාධිකාරී තනතුරේ ආවරණය කිරීම කියන තනතුර මතයි. මෙම නඩුවේ මූලික කාරණා අතර එකක් වුනේ.

පි. ඔව්.
ප්‍ර. මෙම A2 ලේඛනය නිකුත් කරන්නේ සාමාන්‍ය අධිකාරිවරයාගේ අත්සන යටතේ
පි. ඔව්.
ප්‍ර. මෙම ලේඛනයේ අන්තර්ගතය සම්බන්ධයෙන් ඉල්ලුම්කාරියට මැදිහත් වීමේ හැකියාවක් තිබෙනවා ද
පි. අභියාචනයක් ඉදිරිපත් කිරීමේ හැකියාව තිබෙනවා.

**නිරීක්ෂණ හා නිගමනයන්**

ඉල්ලුම්කාරිය වන ජී.එන්. විද්‍යාලංකාර මිය 1981.04.01 දින ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පොත් තබන්නා VII ශ්‍රේණියට බඳවා ගෙන ඇති අතර 2021.03.11 ඇය විශ්‍රාම ගොස් ඇති අතර 2012.03.19 සිට ඇය විශ්‍රාම ගිය දිනය වන 2021.03.11 JM-1-1-II (VI ශ්‍රේණියේ ගණකාධිකාරී වශයෙන් අවුරුදු 09ක් සේවය කර ඇත.

ඇය, 2011.02.21 දින ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී විසින් ඔහුගේ අංක 3/2/3/5/7 අ/69 අංක දරන ලිපියෙන් ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයේ VI ශ්‍රේණියේ සහ ගණකාධිකාරී තනතුරත් රාජකාරී ආවරණය කිරීමට පත්කර ඇත. (පිටු අංක 16) එම පත්වීම ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදය යටතේ කල 12.2.5 යටතේ සලකා බැලීමේ දී නිසි පත්කිරීමේ බලතරයා විසින් ඔහු විධිමත් ලෙස පත්කර තබනු තිබිය. (පුරප්පාඩු වී තිබෙන තනතුරක රාජකාරී ආවරණයක් කිරීමට යොදාඇති දෙපාර්තමේන්තුමය වැඩ පිළිවෙලක් යටතේ එම රාජකාරිය ආවරණය කරන නිලධාරියෙකුට වැඩ බැලීමේ වැටුපක් නොහොත් කිසිදු අතිරේක පාරිශ්‍රමිකයක් ලබා ගැනීමට නුපුළුවන.)

මේ අනුව ඉල්ලුම්කාරියට රාජකාරී ආවරණය කළ කාලසීමාව සඳහා වැඩ බැලීමේ දීමනාව ලබා ගැනීමට හිමිකම් නොමැති බව නිරීක්ෂණය වේ. තවද ඉල්ලුම්කාරිය රාජකාරිය ඉටු කිරීමකට හෝ වැඩ බැලීමකට නිසි බලධරයා විසින් විධිමත් ආකාරයට පත්කර නොමැති බව නිරීක්ෂණය විය.

ඉල්ලුම්කාරිය ඇයගේ පළමු ප්‍රකාශයේ වැඩ බැලීමේ දීමනාව ගෙවූ නිලධාරීන් 04 දෙනෙකුගේ නම් ඉදිරිපත් කර ඇතත්, ඔවුන්ට විධිමත්ව රාජකාරී ඉටු කිරීමට ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව පත් කර තිබූ හෙයින්, ඔවුනට ආයතන සංග්‍රහයේ VII හි 12.5.1 හා 12.3 අනුව මාසික දීමනාවක් ගෙවා ඇත. එම ගෙවීම් නිවැරදි බව තහවුරු වේ. පිටු අංක (43,44,45,46) ඇමුණුම් (Aii-i,Aii.ii Aii. iii Aii-iv) තවද 2020.06.01 සිට 2021.03.11 දක්වා ද ඇය පත්කර ඇත්තේ රාජකාරී ආවරණය කිරීමටයි. මේ පිළිබඳව ඇය 2020.05.20 ගාල්ල දිස්ත්‍රික් කළමනාකරු වෙත රාජකාරී ආවරණය කිරීමට ඇය එකඟ නොවන බවටත් ඇය වැඩ බැලීමේ පදනමෙන් විධිමත්ව පත් කරන්නේ නම් පමණක් එය ඉටු කල හැකි බව දැනුම් දී තිබුණි.

මෙම ලිපියට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ඔහුගේ අංක 3/2/3/10/2/108 හා 2020.07.08 දින දරන ලිපියෙන් දැනුම් දී ඇත්තේ ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.2 යටතේ සඳහන් උපදෙස් අනුව ඉල්ලුම්කාරියගේ ඉල්ලීම ඉටු කිරීමට හැකියාවක් නොමැති බවටත් අදාළ කාලසීමාව ජී.එන්. විද්‍යාලංකාර මහත්මියට රාජකාරී ආවරණය කිරීමට කටයුතු කරන ලෙසට දැනුම් දෙන ලෙසටයි. (පිටු අංක 37)

මේ අනුව ඉල්ලුම්කාරියට ඉහත කාල සීමාවටද වැඩ බැලීමේ දීමනාවක් ලබා ගැනීමේ ප්‍රතිපාදන රාජකාරී ආවරණය කිරීම තුළ සැලසී නොමැති බවයි. එහෙත් ඇය විශ්‍රාම ගොස් සිටියත් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අභියාචනා කිරීමේ අයිතිය නඩු විභාගයේදී දෙවන පාර්ශ්වය විසින් තහවුරු කර ඇත. (පිටු අංක 273,274,275)

**ප්‍රදානය**

ඉහත කාරණා හේතුවෙන් කාර්මික නීතියේ ඉහළින්ම පිළිගැනෙන යුක්ති සහගත හා සාධාරණය නිගමනයන් වශයෙන් කිසිදු ප්‍රදානයක් කිරීමට හේතු සාධක නොමැති බැවින් එවැනි නිගමනයන්ට නොඑළඹෙමින් මෙම අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරමි.

ඒ.බී. හේරත්,
බේරුම්කරු.

2023 ජූලි මස 07 වැනි දින,
කාර්මික අධිකරණයේදී ය.
EOG 08 - 0226

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.